**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - 2018**

----------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විවෘත විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම්

හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍යය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් " මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුමරකරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ට අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල නොදැක්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් වටිනාකම රු.149,950,000 ක් වූ ඉඩම් 11 ක හා වටිනාකම රු.236,567,269 ක් වූ පුස්තකාල පොත්වල සාධාරණ අගය (Fair Value) නිරූපණය වී නොතිබුණි. | පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2018 වසර තුලදී පුස්තකාලය සතු සියළුම පොත් භෞතිකව ගණනය කරන ලදී. නමුත් එම පොත්වල වටිනාකම අගය කිරීමේ කාර්යය සඳහා විශාල කාලයක් ගතවන බැවින් 2018 වසරේදී මූල්‍ය ප්‍රකාශන වල ප්‍රත්‍යාගණන අගයන් හෙලිදරව් කිරීමට නොහැකි විය. | ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අතර වත්කම් වල සාධාරණ අගය නිරූපණය කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය අවසාන තොග ශේෂය භෞතිකව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම ආයතනයේ ගිණුම් ප්‍රතිපත්තිය වුවද ප්‍රධාන ගබඩාවේ රු.5,594,534 ක් වූ ලෙජර් ගිණුමේ තොග ශේෂය පදනම් කරගෙන ගිණුම්ගත කර තිබුණි. | ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල පොත් තොග ශේෂය ගණනය කිරීමේදී භෞතික ශේෂය, පොත් ශේෂය හා සැසැඳීමක් සිදුකරනු ලබයි. මෙම කටයුත්ත 2019 වසරේ සිට ක්‍රමවත්ව සිදුකර ඒ සම්බන්ධ තොරතුරුද විගණනයට ලබාදීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

**1.5.4 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු.34,847,854 ක් වූ අස්පෘෂ්‍ය වත්කම්වල ඵලදායී ජීවිත කාලය තක්සේරු කර ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. | අස්පෘෂ්‍ය වත්කම් යටතට OMIS හා Network පද්ධතියන් හා E-books ද ඇතුලත්වේ. OMIS පද්ධතිය අවුරුදු 10 ක් පුරාවට විශ්වවිද්‍යාලය තුල ක්‍රියාත්මක වන අතර, අනෙකුත් පද්ධතියන් හා E-books සම්බන්ධයෙන් ද ඒවායේ ජීවිත කාලය පිළිබඳ නිශ්චිත තහවුරුවක් කිරීමට අපහසුය. එම නිසා එම වත්කම් ක්‍රමක්ෂය කිරීමක් සිදුනොකරන ලදී. | සියලු අස්පෘශ්‍ය වත්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමටත් ඵලදායී ජීවිත කාලය හඳුනාගෙන ක්‍රමක්ෂය කිරීමටත් ක්‍රියා කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1988 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා ගිවිසුම් කඩකල අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ 14 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.48,085,752 ක මුදලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය දක්වාම අයකර ගෙන නොතිබුණු අතර ගිවිසුම් කඩකල තවත් නිලධාරින් 15 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.35,521,351 ක් වූ මුළු ගිවිසුම් ගත වටිනාකමින් රු.18,499,495 ක් පෙර වර්ෂය දක්වා අයකර ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේදි එම නිලධාරින්ගෙන් කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. | මුල් ණයකරු හා ඇපකරුවන් දී ඇති ලිපිනයන් හැර ගොස් ඇති බැවින්ද, වර්තමාන ලිපිනයන් සොයා ගැනීමට නොහැකි වීම මත නිලධාරීන් 06 දෙනෙකුට නඩු පැවරීමට නොහැකි වී ඇත. එසේම ඇතැම් නිලධාරීන්ට නඩු පැවරීමට කටයුතු කරමින් පවතින අතර, ඇතැම් නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් වාරික ලෙස අයකර ගැනීමටත් ඇතැම් නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් අර්ථසාධකයෙන් අයකර ගැනීමටත් කටයුතු කරමින් පවති. | නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා පියවර ගත යුතුය. |
| (ආ) | කාර්යමණ්ඩලයේ 56 දෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අය නොවූ සේවක ණය ශේෂය රු.2,497,789 ක් වූ අතර ඒ තුළ ආයතනය හැර ගිය කාර්යමණ්ඩලයේ 47 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,754,223 ක් විය. | මෙම අය නොවූ සේවක ණය වලින් සේවකයින් 6 දෙනෙකුට අදාලව රු. 6,400.00 වූ ණය මුදල හැරුණු කොට ඉතිරි ණය මුදල්, සැපයුම් හා මුදල් චක්‍රලේඛ අංක. 40 හා 59 ට අනුව අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදි අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. | අදාළ ණය මුදල් අයකර ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදීයට අනුකූල නොවීම**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 751(1) | ප්‍රධාන කාර්යාලයෙන් නිකුත් කරන ලද පාඨමාලා පොත් හා අධ්‍යයන ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවල තොග පොත් නඩත්තු කර නොතිබුණි. | පාඨමාලා පොත් හා අධ්‍යයන ද්‍රව්‍ය තොග නඩත්තු කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දී ඇති අතර එය දැන් යාවත්කාලීන කරනු ලබයි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 756 සහ 757 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද 2018 දෙසැම්බර් 31 දිනට රු.236,567,269 ක් පිරිවැය වූ පුස්තකාල පොත් හා රු.4,748,975 ක් පිරිවැය වූ උපාධි ලෝගු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | 2018 වසරේදී පුස්තකාල පොත් හා උපාධි ලෝගු සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර ඇත. පුස්තකාල පොත් සම්බන්ධව සමීක්ෂණ මණ්ඩලයෙන් ලබාදුන් නිර්දේශයන්ට අදාලව ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් 2019 මාර්තු මාසයේදී පාලක සභාවට ද කරුණු ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා පාලක සභා අනුමැතියද ලැබී ඇත. | |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යයන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහයේ | | | | |
| | (i) | XX වැනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය | ආයතනයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම පැමිණීම හා පිටවීම සටහන් කළ යුතු වුවත් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශයේ නිලධාරීන් සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර පැමිණීම සනාථ කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | මේ සඳහා විශ්වවිද්‍යාල පද්ධතියේම වෙනසක් සිදුකල යුතුය. මේ පිළිබඳව 2014 වසරේ පැවති COPE රැස්වීමේදී ද සාකච්ඡා කල අතර, ඒ සඳහා ක්‍රමවේදයක් ඇති කිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ද එකඟ විය. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) | XXVI වැනි පරිච්ඡේදයේ 3.2 හා 3.3 වගන්තිය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් තුළින් හඳුනාගන්නා ස්ථාවර වත්කම් අස්ථානගත වීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමෙන් පසු අදාළ ඌනතාවයට, අස්ථානගත කිරීමට හෝ හානියට වගකිව යුතු තැනැත්තා හඳුනාගෙන එම තැනැත්තාගෙන් එය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අගය අයකර ගත යුතු වුවත් එසේ කර නොතිබුණි. | තොග සමීක්ෂණ වාර්තා වලින් පසුව විගණන අංශය වෙතින් දන්වනු ලබන ඌනතා සහ ස්ථාවර වත්කම් නැතිවීම හා අහිමිවීම පිළිබඳ ලැබෙන වාර්තාවලට අනුව ඉදිරියේදී කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය 1.1.7 වගන්තිය | නිලධාරියෙකු මාරු වී පැමිණ මාස 02 ක් ඇතුළත හෝ නිලධාරියෙකු මාරු වී ගොස් මාස 03 ක් ගත වීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂයන් පියවීමට වගබලා ගත යුතු වුවද ඊට පටහැනිව නිලධාරීන් 08 කුගෙන් අයවිය යුතු එකතුව රු.490,794 ක් නිරවුල් කර නොතිබුණි. | වෙනත් විශ්වවිද්‍යාලවලට මාරුවී ගිය සේවකයින් 3 දෙනෙකුට අදාලව නිරවුල් නොවූ ණය ශේෂයන් පවතියි. එම ණය නිරවුල් කරන ලෙස අදාළ විශ්වවිද්‍යාල වලට දැනුම් දී ඇති අතර සිහි කැඳවීම් ද යොමු කර ඇත. මෙම ශේෂය 2019 වසර තුල නිරවුල් කර ගැනීමට අවශ්‍ය පියවර මේ වන විටත් ගෙන ඇත. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක OU/F/IC/01 දරන උපකුලපතිවරයා විසින් නිකුත් කරන ලද උපදෙස් පත්‍රිකාව | අත්තිකාරම් මුදල් ලබාගත් දින සිට දින 30 ක් ඇතුළත නිරවුල් කළ යුතු බව දක්වා තිබුණද 2018 වර්ෂයේදී නිකුත් කරන ලද එකතුව රු.1,221,719 ක් වූ අත්තිකාරම් 40 ක් නිරවුල් කිරීමේ කාලය දින 60 ද ඉක්මවා තිබුණි. | ඔබ විසින් සඳහන් කර ඇති අත්තිකාරම් මුදල් වලින් අත්තිකාරම් මුදල් 31 ක් 2018-02-28 සිට 2018-04-17 දක්වා විශ්වවිද්‍යාල සේවක වැඩ වර්ජනය පැවතීම නිසා නිරවුල් කිරීම සිදු කර ඇත්තේ අප්‍රේල්, මැයි මාසවලදීය. ඉතිරි මුදල් අත්තිකාරම් මුදල් ලබාගත් දින සිට දින 30 ක් ඇතුලත නිරවුල් කර නොමැති බව පිළිගනිමි. | අදාළ උපදෙස් පත්‍රිකාව අනුව කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.337,287,562 ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූප අතිරික්තය රු.125,553,169 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.462,840,371 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍ය ආදායම රු.388,718,248 කින් අඩුවීමත් කෙටිකාලීන පාඨමාලා ආදායම රු.29,891,638 කින් අඩු වීමත් ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2** **අනුපාත විශ්ලේෂණය**

---------------------------

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 0.9:1 ක් වූ අතර පසුගිය වර්ෂය හා සැසඳිමේදී සියයට 36 ක පහළයාමක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අතිරික්ත පොත් මුද්‍රණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පිරිවැය රු.21,283,087 ක් වූ පොත් 121,248 ක් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. | පෙර වර්ෂවලදී කරන ලද සමීක්ෂණයන්හිදී පොත් අතිරික්තයක් මධ්‍යම පොත් බෙදාහරීමේ මධ්‍යස්ථානයේ පවතින බව නිරීක්ෂණය වී ඇත. මෙලෙස පොත් අතිරික්තයක් ඇති වීම සඳහා පාඨමාලා සඳහා අයදුම් කරන ලද සිසුන් සියළුදෙනා ලියාපදිංචි නොවීම, ලියාපදිංචිවීම සඳහා පැමණේයැයි ශිෂ්‍ය සංඛ්‍යාව නිරවද්‍යයව නිර්මාණය කිරීමේ දුෂ්කරතාවය සහ පාඨමාලා ගුණාත්මකභාවය ඉහළ දැමීම සඳහා පාඨමාලා පොත් වරින් වර සංශෝධනයට ලක්කළ යුතුවීම යනාදී කරුණු හේතුවිය. නිවැරදිව පුරෝකථනය කර පොත් අතිරික්තය අවම කිරීමට කටයුතු කර ඇත. | අනවශ්‍ය ලෙස පොත් මුද්‍රණය කිරීම වළක්වා ගැනීම සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථානවල තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කල යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | විශ්වවිද්‍යාලය විසින් පරිහරණය කරන නමුත් නිත්‍යානුකූලව හිමිකම් පවරා නොගත් ඉඩම් 11 ක රු.266,539,328 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබූ අතර එම ඉඩම් පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි. | ඉඩම් වල නීත්‍යානුකූලව අයිතිය ලබාගැනීමට විශ්වවිද්‍යාලය නිරන්තරයෙන්ම කටයුතු කරමින් සිටියි. | ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයන්ගේ අධ්‍යාපන කටයුතු වලට අදාළ වැඩසටහන් නිෂ්පාදනය කිරීම සඳහා රු.මිලියන 306.3 ක් වටිනා ගොඩනැගිල්ලක රු.මිලියන 133.2 ක් වටිනා උපකරණ සහිතව අධ්‍යාපන තාක්ෂණ හා මාධ්‍ය අංශය (CETMe) පිහිටුවා තිබුණි. එමඟින් වාණිජමය අරමුණු පදනම් කරගෙන බාහිර වැඩසටහන් නිෂ්පාදනය සිදුකළ හැකිව තිබූ නමුදු ඉන් ආදායම් ඉපැයීමට හෝ ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා ඵලදායිව යොදා ගැනීමට විගණිත දිනය වූ 2019 ජූනි 30 දක්වාම කටයුතු කර නොතිබුණි. | අධ්‍යයන පීඨවල ශ්‍රව්‍ය-දෘෂ්‍ය අධ්‍යයන ද්‍රව්‍ය නිපදවීම සඳහා වුවත්, පෙර සිටම මෙම ආයතනයේ තාක්ෂණික උපකරණ නඩත්තුවට හා විශ්වවිද්‍යාලයට ආදායම් ඉපයීම සඳහා ද දායකත්වයක් දැරීමට, ආදායම් උපයන ආයතනයක් ලෙස කටයුතු කිරීමට සිදුවිය.<br>වසර 05 කට පමණ පෙර මාධ්‍ය මන්දිරයේ ශබ්දාගාරය කුලියට දීම මඟින් ප්‍රමාණාත්මක ආදායමක් උපයා තිබුණද අද වන විට බාහිර නාලිකා නව ශබ්දාගාර ගොඩ නගා ප්‍රයෝජනයට ගනු ලබන බැවින් ඉල්ලුම පහත බැසීමට හේතු වී ඇත. | සිසුන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් උපරිම ප්‍රයෝජනයට ගැනීමට සුදුසු ක්‍රමවේදයක් ඇතිකළ යුතුය. එසේම බාහිර පාර්ශවයන්ට අදාළ ශබ්දාගාර කුලියට දීමෙන් ආදායම් ඉපයීම සඳහා ප්‍රචාරණය හා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2010 වසරේදී ස්ථාපනය කර තිබූ ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවයේ පරිපාලන කටයුතු 2015 මාර්තු 01 දින වන විට විවෘත විශ්වවිද්‍යාලය වෙත පැවරීමත් සමඟ වර්තමානයේ විශ්වවිද්‍යාලය තුළ වූ ගොඩනැගිල්ලක එම ඒකකය පිහිටුවා තිබුණි. මෙම ව්‍යාපෘතිය මඟින් 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා එකතුව රු.100,757,839 ක ආදායමක් උපයා තිබුණද සමාලෝචිත වර්ෂය වනවිට ආදායමක් ඉපයීමට හැකි අයුරින් යොදා ගැනීමට අපොහොසත් වී තිබුණි. | විවෘත විශ්වවිද්‍යාලයේ ජාල පද්ධතිය හා සම්බන්ධ කර එහි කටයුතු යථාතත්වයට පත් කිරීම සඳහා වසරක පමණ කාලයක් ගත විය. තාක්ෂණික සේවාවන් නිසි පරිදි ලබා දීමට බාධාවන් ඇති වූ බැවින් මෙම ආයතනය අමාත්‍යාංශය යටතේ පැවති කාලයේදී ලැබූ ආදායම් ලබා ගැනීමට නොහැකි විය.<br>විශ්වවිද්‍යාලයට පවරා දෙන අවස්ථාවේ මෙහි භාවිතා කළ තාක්ෂණික උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා මුල්‍ය ප්‍රතිපාදන සැපයීමට අමාත්‍යාංශය එකඟතාව පළ කලත්, පසුව එම මුදල් ලබාදීම සිදු නොකරන ලදී. එම නිසා පැරණි ශ්‍රව්‍ය දෘශ්‍ය සම්මන්ත්‍රණ පහසුකම් සඳහා භාවිත කළ උපකරණ භාවිතයෙන් ඉවත් කිරීමට විශ්ව විද්‍යාල පරිපාලනයට සිදු විය. | තාක්ෂණික උපකරණ ලබා ගැනීම සහ අළුත්වැඩියා කළ හැකි උපකරණ අළුත්වැඩියා කර වඩා ඵලදායී ලෙස පවත්වාගෙන යාම තුළින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ප්‍රතිමාන සංග්‍රහය (Norms) ප්‍රකාරව සාමාන්‍යයෙන් වසර 04 කට වරක් සියලු පාඨමාලා නැවත සංශෝධනය කර යාවත්කාලීන කළයුතු වුවත්, විශ්වවිද්‍යාලයේ බොහෝ පාඨමාලා සම්බන්ධයෙන් එවැනි සංශෝධනයන් (Course Revise) සිදුකර නොතිබූ අතර ප්‍රමාද කාලය වර්ෂ 02 සිට වර්ෂ 24 දක්වා ඉහළ පරාසයක් ගෙන තිබුණි. | වර්තමානයේ විශ්වවිද්‍යාලය සතුව පාඨමාලා 1000 ක් පමණ ඇති අතර, එක පාඨමාලාවක සාමාන්‍ය පාඩම් සංඛ්‍යාව 25 ක් පමණ වේ. එම නිසා පාඨමාලාවන්ට අදාල සියළු පාඩම් 25,000 කට වඩා තිබේ. සියළු අධ්‍යයන කාර්යය මණ්ඩල Norms වලට අදාලව කළයුතු උපරිම පාඩම් වසර 04 ක් තුල 6,000 ක් පමණ වේ. එම නිසා මෙමඟින් පාඨමාලා සෑම වසර 04 කට වරක් සංශෝධනය කල නොහැකි බව පැහැදිලිවේ. කෙසේ වෙතත් අවශ්‍ය අවස්ථාවලදී පාඨමාලා සංශෝධනය කිරීමට විශ්වවිද්‍යාලය පියවර ගෙන ඇත. | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ප්‍රතිමාන සංග්‍රහය (Norms) අනුව කටයුතු කළ යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දුරස්ථ අධ්‍යාපන ව්‍යාපෘතිය (DEMP) මගින් විශ්වවිද්‍යාලය වෙත 2009 වර්ෂයේදී ප්‍රදානය කර තිබූ රු.1,580,000 ක් වටිනා කුඩා පොලිතීන් ඇසුරුම් සකස්කළ හැකි යන්ත්‍රය ප්‍රදානය ලද වර්ෂයේ සිට සහ තවත් විශ්වවිද්‍යාලය සතු ස්ථාවර වත්කම් අයිතම 128 ක් වසර 2 සිට වසර 7 අතර කාල පරාසයක් තුල නිශ්කාර්යව පැවතුණි. | පොලිතින් ඇසුරුම් යන්ත්‍ර විශ්වවිද්‍යාලයේ විදුලි හා පරිගණක අංශය වෙත ලබාදී ඇත. | භාවිතා කල හැකි හා නොහැකි වත්කම් හඳුනාගෙන භාවිතා කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |

**3.5 ප්‍රමාද වූ ව්‍යාපෘති**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෞඛ්‍ය විද්‍යා පීඨයේ පස්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2016 ඔක්තෝබර් 11 දින රු.මිලියන 402.5 ක් නිර්දේශ කර ඇති අතර එදින සිට වසර 02 කින් ඉදිකිරීමේ කටයුතු නිමකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටද අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | සෞඛ්‍ය විද්‍යා පීඨයේ පස් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කර ඉදිකිරීමේ (Design & Build) ක්‍රමවේදය යටතේ කැබිනට් මණ්ඩලය විසින් පත් කල ප්‍රසම්පාදන කමිටුව (SCAPC) මගින් කෙරේ. ඊට අවශ්‍ය මූලික කටයුතු එනම් ලංසු ලේඛන සැකසීම 2017 අවසාන කාර්තුව වන විට නිම කර තිබූ අතර මේ වන විට තාක්ෂණ ඇගයීම් කමිටු සැසි පවත්වා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අනුමැතිය ලබා ගනු පිණිස කැබිනට් මණ්ඩලයට යොමු කර ඇත. කැබිනට් අනුමැතිය ඒ සඳහා ලද වහාම තෝරා ගත් කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කටයුතු කෙරේ. | අදාළ ව්‍යාපෘතින් ප්‍රමාදයකින් තොරව ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | අධ්‍යාපන පීඨයේ සිව්වන මහලේ වහලය අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2016 වර්ෂයේදී රු.5,392,936 ක් වැය කර තිබුණද 2018 දෙසැම්බර් 31 දක්වාම අදාළ කාර්ය නිම කිරීමට කටයුතු කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. | අදාළ කොන්ත්‍රාත්තුව සිදු කරගෙන යාමේදී සුමනසේකර කන්ස්ට්‍රාක්ෂන් (පුද්) සමාගම (කොන්ත්‍රාත්කරු) විසින් සිදු කල ගිවිසුම් කොන්දේසි කඩ කිරීම මත කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලදි. ඊට අදාළ නීතිමය කටයුතු කෙරෙමින් පවතින බවද සඳහන් කරමි. තවද ගොඩනැගිල්ල ඉදි කිරීමට අදාළ ඉතිරි වැඩ මේ වන විට සම්පූර්ණයෙන් පාහේ නිම කර ඇත. | |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 112 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 162 ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි. | සෞඛ්‍ය විද්‍යා පීඨයේ හා ඉංජිනේරු තාක්ෂණ පීඨයේ බඳවා ගැනීම් සිදුකර අවසන් අතර, අධ්‍යාපන පීඨයේ බඳවා ගැනීම් සිදුකරමින් පවතී. ඉතිරි අධ්‍යයනාංශ සඳහා පුරප්පාඩු දැන්වීමක් පලකිරීමට කටයුතු කරමින් පවතී. පරිපාලන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සිදුකරනු ලැබේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර තිබුණද ආයතනයේ සමස්ත අරමුණු ඉටුකර ගැනිම සඳහා අදාළ සැලසුම් උපයෝගී කර ගැනිම කෙරෙහි ඉහළ කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම වසරින් වසර යාවත්කාලීන කර මහා භාණ්ඩාගාරය වෙත ද යවනු ලැබේ. මෙය පාදක කර මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන නිකුත් කරනු ලැබේ. | විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීමට හැකි වන අයුරින් සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට පියවර ගත යුතුය. |

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටු වී තිබේද යන්න පැහැදිලිව හඳුනාගැනීමට හැකිවන පරිදි පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම වසරින් වසර යාවත්කාලීන කර මහා භාණ්ඩාගාරය වෙත ද යවනු ලැබේ. මෙය පාදක කර මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන නිකුත් කරනු ලැබේ. | විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීමට හැකි වන අයුරින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට පියවර ගත යුතුය. |

## 4.3 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය (OMIS) සඳහා රු.3,000,000 ක පිරිවැයක් දරා අංශ 05 ක කටයුතු සම්බන්ධයෙන් මොඩියුල 05 ක් යටතේ ස්ථාපනය කර තිබුණද එම පද්ධතියේ පැවති අඩුපාඩු හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | 2018 වර්ෂයේ නොවැම්බර් මාසය වන විට නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් විකසනය (Development) කිරීම සඳහා නව සේවක මණ්ඩලයක් සේවයට බඳවා ගෙන, අදාළ මූලික වැඩ කටයුතු ආරම්භ කරන ලදී. | විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයන් අනුව නිවැරදි හා කාර්යක්ෂම තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.4 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අයවැය ගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 32 සිට සියයට 1,379 දක්වා ප්‍රමාණාත්මක විචලතාවයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය. | පසුගිය වසර වල තථ්‍ය වියදම හා පුරෝකථනයන් පදනම් ව ඉදිරි වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සිදුකරන අතර, එම ඇස්තමේන්තු ගත වියදම හා තථ්‍ය වියදම අතර විචලතාවයන් ඇතිවිය හැකිය. නමුත් මෙම විචලතාවයන් තව දුරටත් අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අයවැය ලේඛනය සකස් කිරීමේදී මූල්‍ය පාලනයක් සිදු කිරීමේ අරමුණින් එය සිදුකළ යුතුවේ. පසුගිය වර්ෂ වල තථ්‍ය සංඛ්‍යා මත හා අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට යෝග්‍ය වන අයුරින් අයවැය ලේඛනය පිළියෙල කළ යුතුය. |

## 4.5 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳව ජාතික අයවැය දෙපාර්තමේන්තුව නිකුත් කළ චක්‍රලේඛ සහ එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව විශ්වවිද්‍යාලය දැනුවත් වී තිබුණි. විශ්වවිද්‍යාලයේ තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන තිබූ නමුත් ඊට අදාළ වැඩසටහන් සැලසුම්වලට ඇතුළත් කිරීම, සංඩිස්ථාන. හඳුනා ගැනිම, කාර්යසාධන දර්ශක හඳුනා ගැනිම, වැඩ සටහන් සම්බන්ධ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි. | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණ සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව විවෘත විශ්වවිද්‍යාලය දැනුවත් වී ඇත. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනිම කෙරෙහි අවධානයක් යොමු කළ යුතුය. |